03/07/2011 - ලංකාදීප

**අලුත් යුගයක් වෙනුවෙන් අනාවරණය කරගත යුතු යථාර්ථය - මිලින්ද මොරගොඩ**

ශ්‍රී ලංකාවේ අන්ධකාර යුගය අවසන්ය. ගැටුම් හා ත්‍රස්තවාදී අරගල පැවති යුගය අමිහිරි එමෙන්ම දුර්භාග්‍ය සම්පන්න කාලසීමාවකි. උතුරේ සහ දකුණේ ජනතාව දශක තුනක් මෙම අන්ධකාර සමයේ ජීවත්විය. පැවති ආණ්ඩු විවිධ උපාය හා සංකීර්ණ පිළිවෙත් ඔස්සේ ත්‍රස්තවාදයට විසඳුමක් සොයන්නට උත්සාහ කළේය. වර්තමාන ආණ්ඩුව මානුෂික මෙහෙයුමක් මගින් ත්‍රස්තවාදය පරාජය කර එක්සත් දේශයක් නිර්මාණය කරන මාවතේ ආරම්භයට පැමිණ තිබේ. ත්‍රස්තවාද පරාජය කිරීම සමග අවතීර්ණ වූයේ ආශ්චර්යවත් අවස්ථාවකටය. සාමය අභියෝගයකි. සැනසිලිදායකබව විඳින සමාජය එහි අසිරියෙන් ප්‍රීති වෙති. එහි සීමාවක් නැත. අද පරපුරට දැන් අවශ්‍ය නව දර්ශනයකි. සමාජයේ සියලු දෙනාට ගරුත්වයෙන් ආත්මාභිමානයෙන් සිටිය හැකි පරිසරයකි. අලුත් අනන්‍යතාවයක් ඇති කර ගැනීමකි. ලාංකික උරුමය සොයා එය තහවුරු කර ගැනීමකි.

ගෙවී ගිය පොසොන් මාසය ශ්‍රී ලාංකික උරුමය දෙස අලුතින් බලන්නට අවස්ථාවක් උදා කළේය. බුද්ධාගම දේවානම් පියතිස්ස රජ දවස ඉන්දියාවේ ධර්මාශෝක අධිරාජ්‍යයාගෙන් මෙරටට ලැබුණ තිළිණයකි. මිහිඳු මහ රහතන් වහන්සේ ඇතුළු පිරිස මිහින්තලාවට වැඩමකර ලාංකික සමාජයට බෙදා දුන් දැක්ම රටට අනන්‍ය කර ගන්නට අප සමත් විය. දැන් බුද්ධ දේශනාව හා බුදු දහම ලාංකික එකකි. සංස්කෘතික හා සාහිත්‍ය රටා සමග මුසු වී මෙරට ජන හදවත් තුළ නව පදනමක් සකස් කළේය. ශ්‍රී වර්තමානයේ බුදු දහම ජාත්‍යන්තරයට යොමු කරන්නට ද මෙරට මහා සංඝරත්නය සමත්ය. අන්‍ය රටක යහපත් දැක්මක් මෙරටට ඔබින ලෙස සකස් කර ගන්නට ශක්තිය අපට තිබිණ. ජනසමාජය බුදු දහම නොරටින් පැමිණි බව දක්වා ප්‍රතික්ෂේප කළේ නැත. බුදුරජාණන් වහන්සේ වැඩ සිටි බිමටත් වඩා බුදු හිමියන්ගේ දැක්ම හා භාවිතාව දක්නට ලැබෙන්නේත් ආරක්ෂා වී ඇත්තේත් ශ්‍රී ලංකාවේය. එය සුවිශේෂී කාරණාවකි. මෙවර පොසොන් සමයේ දී නැවත නැවතත් තහවුරු වූයේ එකී දැක්මයි.

අද මෙරට බෞද්ධ යන ධර්ම දේශනාව, භාවනාව, මහා සංඝරත්නයේ පිළිවෙත් සම්බන්ධව නොයෙකුත් ප්‍රමිතීන් තමුන් විසින්ම සකස් කර ගනිමින් සිටින අවස්ථාවකි. පසුගිය වකවානුවේ 2600 වැනි සම්බුද්ධත්ව ජයන්තිය ගැන විශාල උනන්දුවක් පතුරවන ලද අතර එම සුවිශේෂී අවස්ථාවේ දී බුදු දහමේ නියම හරය හා භාවිතාව ගැන අවධානය යොමු කරන්නට මම උනන්දු වූයෙමි. ලොව පුරා බුද්ධිමතුන් දහමේ හරය ප්‍රශ්න කරමින් එහි මග පෙන්වීම අවබෝධ කරගනිමින් සිටින යුගයක එහි ශක්තියලබා ගැනීමේ හැකියාව අපට ඇත. බුද්ධ දර්ශනය, බොදු පිළිවෙත් හා භාවිතාව සම්බන්ධව විනය කතිකාවතක් ඇරඹීම සුදුසු බව මම යෝජනා කළෙමි.

බුදුරජාණන්වහන්සේ කාලාම සූත්‍ර දේශනාවේදී සඳහන් කර ඇති වදන වර්තමානයට ගැලපෙයි. එහි කියැවෙන්නේ රන් කරුවෙකු තමන් අතට පත්වන රන් කැබැල්ල පිරිසිදු රන් දැයි සොයා බලන්නට කපා, කොටා, සූරා බලන බවයි. රසායනික යොදා පුලුස්සා නියම රන් දැයි බලන අතර පිරිසිදු රත්‍රන් බව පැහැදිලි කර ගනී. බුදු රජාණන් වහන්සේ කාලාම සූත්‍රයේ දී දක්වන්නේ බුදු වදන වුවත් ප්‍රශ්න කර, සාකච්ඡා කර තෝරා බේරා විමසුම් සිතින් සත්‍ය පසක් කර ගත යුතු බවය.

වර්තමාන ශ්‍රී ලාංකික සමාජය ගමන් කළ යුතු දිසාව දෙස ගැඹුරු අවබෝධයක් මෙම බුදු වදනින් ලබා ගත හැකිය. කිසිවෙකු කිසිම කාරණයක් ප්‍රශ්න කිරීමෙන් තොරව පිළිගත යුතු නැත. යහපත් සංවාදයක් තුළින් හරය අනාවරණය වෙයි. සත්‍ය පසක් කර ගත හැකිය. මිත්‍යාව විසින් අවුරා ඇති සියලු අවස්ථා අනාවරණය කර සත්‍ය සොයාගන්නට බුදුන් වහන්සේ තමන්ගේම ධර්මය ගැන දක්වන හෙළි වදන මැනවින් වටහා ගත යුතුය.

පොසොන් සමයේ දී ද බොදු ජනතාව දාන ශීල ඇතුලු විවිධ ආගමික වතාවත් පැවැත්වූහ. ඒවා ව්‍යාපාර තරමට වැඩි දියුණු බව දඅකගතහැකි විය. පින් කැමැති පිරිස් හා නොයෙක් කණ්ඩායම් එකමුතුවී පවත්වන දන්සැල්, තොරණ හා වෙසක් කූඩු සහ සැරසිලි මගින් ලෞකිකත්වයට වඩා නැඹුරු, විනෝදකාමී අවස්ථා නිර්මාණය කර තිබිණ. වසරින් වසර මෙම අංග තව තවත්

සංකීර්ණවීමක් දැකිය හැකිය. පසුගිය වෙසක් උත්සව අවස්ථාවේ දී වෙසක් කලාප වානිජ මට්ටමින් වර්ධනය වීම නිසා බෞද්ධ ජනතාව තුළ සංවේගයක් ඇති කරන ලද බවද පෙනී යයි. බුදු දහමේ හරය කොතැනද, එහි උරුමය ඇත්තේ කොතැනද යන්න වෙනුවට ප්‍රචාරය සමග මතු වී ඇති අලුත් බෞද්ධ සංස්කෘතිය රට තුළ හරයක් නැති ප්‍රතිරූප මවා තිබේ.

බුදු දහම යටපත්කරන්නට යටත් විජිත සමයේ දි දරන ලද ප්‍රයත්න අපට මතකය. අන්‍ය ආගම් පතුරවන අවස්ථා හමුවේ සංවිධානය වූ බලවේග ධර්මයේ යථාර්ථය දක්වනවා වෙනුවට එහි ඇති සාටෝප ලක්ෂණ හුවා දක්වා ඇතැම් ජන කොටස් යළි ආකර්ශනය කර ගත්තේය. මෙයින් සිදු වූයේ ධර්මයේ සත්‍යයට එපිටින් බටහිර ගරු කරන අංග එකතුවීමයි. බුද්ධ දේශනාව අනුව මෙවැනි නච්ච, ගීත වාදිත විසූක දස්සන නොගැලපෙයි. නමුත් ඒවා බුදු හිමියන් ගේ ගුණ සමරන මහෝත්සවය හා එකතු වී හමාරය. දැන් සමාජය විසින් ඉදිරියට ගෙන යන්නේ එහි මතුපිටින් ඇති පෙනුම පමණක් ද? මේ අනවශ්‍ය දේ පසෙකින් තබා ධර්මය හා එහි ගැබ්ව ඇති ලක්ෂණ ජීවිතයට සමීප කර ගැනීම වඩා සුදුසුය. එහි දී නියම බෞද්ධ සංකේත ගැන නිසි අවබෝධයක් රටට අවශයය. තොරණ, සැරසිලි හා භක්ති ගීත කාලානුරූපව එකතු වී ඇති නමුත් බුදුරජානන් හන්සේගේ පහස ලැබූ, බුදු රජාණන් වහන්සේ සමග සෘජු සම්බන්ධතාවයක් ඇතැයි විශ්වාස කෙරෙන ආගමික සිද්ධස්ථාන ගැන විශේෂ අවධානයක් යොමු කළ යුතුය.

බුදු දහමේ නියම සංකේත අප හඳුනා ගත යුතුය. දර්ශනය පැහැදිළි කර ගත හැකි වන්නේ එවිටය. වෙසක් සමයේ දී ගිරිහඬු සෑයේ වැදගත්කම මතු කරන්නට උත්සාහ කළෙමි. ශ්‍රී දන්ත ධාතූන් වහන්සේ, බුද්ධත්වය ලබා ගැනීමට පිටදුන් ජය ශ්‍රී මහා බෝධිය සහ බුදු සිරිපතුල බොදුනු ජනතාව මහත් ගෞරවයෙන් සළකන ප්‍රධාන පූජණීය වස්තූන්ය. ඒවා මෙරට ඇති විශේෂිත බෞද්ධ සංකේතයන්ය. නැගෙනහිර පළාතේ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ පිහිටි ගිරිහඬු සෑය ද මෙවැනි වැදගත්කමකින් යුතු පුද බිමකි. ත්‍රස්තවාදී ගැටුම් හෙයින් ජන අවධානයෙන් ගිළිහී ඇති මෙම පින් බිම අද යළිත් බොදුනුවන්ගේ අවධානයට ලක්විය යුතු බව මතක් කළෙමි. බුදුරජාණන් වහන්සේ ජීවමාන අවස්ථාවේ දීම තපස්සු භල්ලුක වෙළඳුන්ට ඔවුන් බුදු රජානන් වහන්සේට පිරිනැමූ පළමු දානය ට පූජා භාණ්ඩ ලෙස ලැබුණ කේෂ ධාතූන් තැන්පත් කර තැනූ මෙරට ප්‍රථම ස්ථූපය සේ වාර්තාගතය. එසේම එය වටා ඇති නටඹුන්, මගින් එහි ඇත්තේ මෙරට පළමු වටදාගෙය බව ද සැළකෙයි. මෙම උරුමය අමතක කරන අප වෙසක් කලාප හා පොසොන් කලාප අතර බෞද්ධකම සොයමින් සිටීම සාධාරණ ද?

මහා වනාන්තරයෙන් වැසී තිබුණ ඓතිහාසික වැදගත් කමකින් යුතු ගිරිහඬු සෑය පුද බිම 1929 වසරේ දී හමුවූ ලියැවිල්ලක් අනුව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ගවේශනයට ලක් කර ඇත. එය තහවුරු වීමෙන් පසු කේෂධාතූන් නිධන් කොට ඉදිකළ ගිරිහඬු සෑය මෙය බව රජයේ ගැසට් නිවේදනයකින් ස්ථිරව ප්‍රකාශයට පත්කර තිබේ. මෙම තොරතුරු දැනගැනීමෙන් අනතුරුව එවකට අග්‍රාමාත්‍ය ධුරය හෙබවූ ඩී. එස්. සේනානායක මැතිතුමා 1951 වසරේදී පුරාවිද්‍යා අධිකාරීව සිටි සෙනරත් පරණවිතාන ශූරීන් ලවා තිරියායේ පුරා විද්‍යා කඳවුරක් ඇති කර මෙම වැදගත් සිද්ධස්ථානය ප්‍රතිසංස්කරණය කර ඇත. පසුව වටදා ගෙය ද හෙළි පෙහෙළි කර මතු කරගෙන තිබේ.

ගිරිහඬු සෑයේ උරුමය අමතක කරන අප ලංකාපටුන ද මතකයෙන් ඈත් කර තිබේ. ලංකාපටුන බෞද්ධ සංස්කෘතියට විශාල සම්බන්ධයක් ඇති නැගෙනහිර බොදු සිද්ධස්ථානයකි. ඉන්දියාවේ කළිඟු රට සිට දන්ත ධාතූන් වහන්සේ මෙරටට වැඩමවන ලද්දේ ලංකාපටුන ඔස්සේ බව ඉතිහාසය කියයි.

පසුගිය දා මෙම ස්ථානයට ගොස් නිරීක්ෂණය කිරීමේ අවස්ථාව ලැබිණ. බණ්ඩාරවෙල සුමේධ හිමිපාණෝ එහි වැඩ වාසය කරති. දුෂ්කරතා එමටය. කොළඹ සිට ගමන් කරන්නෙකුට පොළොන්නරුව, වාලච්චනේ හා වාකරේ ප්‍රදේශ ඔස්සේ ඉලන්කන්තුරෙයි හෙවත් ලංකාපටුනට ළඟා විය හැකිය. හබරන, කන්තලේ හා සේරු නුවර ඔස්සේ ද එහි පැමිණිය හැකිය. වර්ෂ 303-331 අතර කාලයේ දී රජ කළ කිත්සිරි මෙවන් නොහොත් නම් කීර්ති ශ්‍රී මේඝවර්ණ රජ සමයේ හේමමාලා කුමරිය හා දන්ත කුමරුන් ශ්‍රී දළදා වහන්සේ මෙරටට වඩමවා ඇත. කළිඟු රට විසූ ගුහසීව රජු ආක්‍රමණ

අවස්ථාවක දී දන්ත ධාතුන් වහන්සේ ආරක්ෂා කර ගැනීමට එය ලංකාවට වැඩම කරවා තිබේ. පසුව එහි සිට අනුරාධපුරයේ ගල් පාලම පැත්තෙන් රට අභ්‍යන්තරයට වැඩම කර රාජ්‍ය බාරයට පත්වූ බව ඉතිහාසයෙහි සඳහන්ය. මෙම ස්ථානය පුරා විද්‍යා කැනීම් වලට ලක් කරන ලදුව පැරණි වෙහෙරක, පඩිපෙළ හා බැමි යනාදිය තහවුරු කර ඇති බව පෙනේ. ලංකාපටුන කලපුවක් ඔස්සේ සම්බන්ධ කරන අක්කර හැත්තෑ ගණනකින් යුත් දූපතකි. ගොඩබිමින් සම්බන්ධවන පාලම කැඩී ඇති අතර දැනට බැතිමතුන් උදෙසා කුඩා බෝට්ටු සේවාවක් පවත්වාගෙන යයි. බෞද්ධ සැදැහැවතුන්ට මෙහි ඇති ඓතිහාසික බව දැක බලා ගන්නට පැමිණිය හැකි නමුත් දැනට බලවත් ප්‍රශ්නයක් ඇත්තේ පානීය ජලය හිඟකමයි. ලංකාපටුන විහාරාධිපතිව වැඩවසන බණ්ඩාරවෙල සුමේධ හිමිපාණන් ගේ දැඩි කැපවීමකින් අවට ඇති ගම්මාන සහාය කරගෙන දාන වේල සපයා ගෙන දුෂ්කරතා මධ්‍යයේ වැඩ වෙසෙති. හිමිපාණන්ට අනුව මෙම විහාරය කරවා ඇත්තේ කිත්සිරි මෙවන් රජතුමා ගේ මෙහෙයැවීමෙනි. දීර්ඝ කාලයක් අමතක කර තිබුණ මෙම වැදගත් ස්ථානය යළි අවධානයට ලක්වන්නේ 2004 වසරේ පැවති තාවකාලික සාමකාමී කාලයේදීය. එහි මූලික අලුත්වැඩියා කරන ලද නමුත් යළි වන්දනා නඩ පැමිණෙන්නට පටන්ගෙන ඇත්තේ යුද්ධය අවසන් වීමෙන් පසුවය.

ගෞතම බුදුරජානන් වහන්සේ මුතියංගනය, නාගදීපය හා කැළණිය යන ස්ථාන වලට තෙවරක් වැඩම කර ඇති අතර තමන් වදාල ධර්මය පවතින්නේ යැයි දෙසා වදාල දේශය ශ්‍රී ලංකාව බවට මෙරට බොදු ජනතාව අතර මහත් විශ්වාසයක් පවතී. සුමන සමන් දෙවියන්ගේ ආරාධනයෙන් සමනොළ කන්දේ බුදු සිරිපතුල පිහිටුවන ලද බව ප්‍රකාශ වෙයි. ඉන්දියාවටත් වඩා බුදු දහමට සමීප වෙමින් එහි ගැඹුර ගවේශනය කරමින් ලෞකික හා ලෝකෝත්තර ස්වභාවයෙහි හරය සාකච්ඡාවට ලක්වන යුගයක් වර්තමානයේ උදාවී තිබේ. බුදු දහම සමග මෙරට සමාජය, සංස්කෘතිය හා පැවැත්ම විශාල පරිවර්තනයකට ලක්විය. ගම, විහාරස්ථානය වැව හා දාගැබ යන සංකේත මහජනතාවගේ සිත් තුළ සනිටුහන් වූයේ එහි ප්‍රතිපලයක් වශයෙනි.

බුදුරජාණන් වහන්සේ ගේ මග පෙන්වීම අනුව ජීවිතය සකස්කර ගන්නට හා අවංකවම ඒ මග යන්නට කැපවුන ගිහි පැවිදි පිරිසක් වර්තමානයෙහි සිටින බව පැහැදිලිය. නමුත් මේ යථාර්තයට වඩා කැපී පෙනෙන්නේ තන්හාව හා ආශාව අනුව සමාජයේ වඩා කැපී පෙනෙන්නට බුදු දහම අදහන බව පෙන්වන සුලු පිරිසයි. ඔවුහු තමන් ගේ භක්තිය දක්වන්නට හෝ කැපී පෙනෙන්නට ඇති උවමනාව අනුව ගෙනයන පිළිවෙත් මගින් බුදු හිමියන් දෙසු දහමින් හෙළි කරන දර්ශනය මතු වන්නේ නැත. අද සමාජයට අනුව පැතිරවීමට වඩා අවශ්‍ය බුද්ධාගම සම්බන්ධයෙන් ඇති පෙනුම නොව එහි ගැබ්ව ඇති දර්ශනයයි. මේ අවස්ථාවේ බුදු දහම ආගම ලෙස පමණක් සලකා කටයුතු කිරීම සෑහේද?

ශ්‍රී ලංකාවේ ඉතිහාසය හා අනන්‍යතාවය සම්බන්ධ විශාල පුරා වෘත්තයක් මේ ස්ථාන සමග අනාවරණය වෙයි. බුදුරජාණන් වහන්සේ සම්බන්ධ ස්ථාන ගණනාවක් ගැන කියැවෙයි. අද පරපුර යමක් දන්නා නමුත් මේ තැන් අනාගත පරපුර වෙනුවෙන් ආරක්ෂා විය යුතුය. සත්‍ය තතු ගවේශනය කර මහජනතාව තුළ ඇති විශ්වාසයන් ට ගරු කළ යුතුය. ශ්‍රී දළදා මාලිගාව, ජය ශ්‍රී මහා බෝධිය සහ ශ්‍රී පාද පත්මය බොදු බැතිමතුන්ගේ මහත් හරසර ලබන බෞද්ධ සංකේතයන්ය. මුතියංගනය හා කැළණිය වැනි බෞද්ධ සිද්ධස්ථාන ද නිතර බැතිබර ගෞරවයට පාත්‍රවෙයි. එනමුත් බුදු රජාණන් වහන්සේ ගේ අතීත සිදුවීම් වලට සම්බන්ධ ඓතිහාසික තැන් කොපමණ ඇත්ද? ගිරිහඬු සෑය, ලංකාපටුන වැනි ස්ථාන පෙන්වන්නේ ඒවා රැකබලාගෙන වැඩිදියුණු කිරීමේ අවශ්‍යතාවයයි. සෘජුවම ගෞතම බුදුරජාණන් වහන්සේ ට සම්බන්ධ ස්ථාන කෙරෙහි විශේෂ අවධානයක් දැක්වීම අපගේ යුතුකමකි.

සියලු නිකාය නියෝජනය වන පරිදි මහා නායක හිමිපාණන් වහන්සේලාගෙන් සමන්විත විශේෂ කමිටුවක් සම්පාදනය කර මෙරට ඇති බුදු රජාණන් වහන්සේට සම්බන්ධ තැන් නිශ්චිත වශයෙන් හඳුනා ගැනීම වැදගත්ය. පුරා විද්‍යාව හා ඓතිහාසික කරුණු ගවේශනයට සමත්කම් ඇති විශේෂඥ වියතුන්ගෙන් සමන්විත කමිටුවකින් මේ සිද්ධස්ථාන නිසි ප්‍රමිතියකට අනුව ලේඛනගත කිරීමට සහාය ලබා ගත හැකිය. තැනින් තැන අනාවරණය කරන කරුණු අනුව සත්‍යය සොයා බලා විග්‍රහ කිරීම ඔවුන්ට පැවරේ. ඉන් පසුව රජයේ අනුග්‍රහය ඇතිව, ගිහි උපදේශක මණ්ඩලයක් විසින් මෙම ස්ථාන

මතු පරපුර වෙනුවෙන් රැකබලාගෙන වැඩි දියුණු කළ හැකිය. එය ඉතා වැදගත් අවශ්‍යතාවයක් බව පෙනේ. බුදුරජාණන් වහන්සේ විසූ යුගය විශාල ඉතිහාසයකි. ශ්‍රී ලංකාවට සම්බන්ධ වන ඉතිහාසය ද අවුරුදු දෙදහස් හයසියයකට වැඩිය.

මෙම ඉතිහාසයේ අනාවරණ වෙනුවෙන් සැබෑ ගවේශණයකට රට සූදානම් විය යුතුය. එය උදා වූ අලුත් යුගයේ ශ්‍රී ලාංකික අනන්‍යතාවය සොයා යාමේ එක පරිච්ඡේදයකි. රට එහි වැසියන්ගේ මුලාරම්භය, එයට බලපෑ සංස්කෘතික හා ආගමික දර්ශනය සොයා යන විට බොහෝ ප්‍රශ්න වලට විසඳුම් ලැබේ. අතර මැදි යුගයක බටහිර විසින් පතුරවන ලද ජාති ආගම් හා කුළ බෙදීම් මේ අනුව අවම කර ගත හැකිය. පොසොන් උදානය අර්ථවත් කර ගත හැක්කේ එවිටය.